**නිවිතිගල ප්‍රාදේශීය සභාව - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

නිවිතිගල ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට නිවිතිගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර වත්කම් වැඩිදියුණු කිරීම වෙනුවෙන් දරන ලද පිරිවැය රු. 8,817,825 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කරන බව. | ස්ථාවර වත්කම් වැඩිදියුණු කිරීමේ පිරිවැය ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ආ) | කුට්ටි ගල් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා ණයගැති රු. 642,740 ක් සහ ණයහිමි වෙන්කිරීම් රු. 521,112 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කරන බව. | ණයහිමි හා ණයගැති වටිනාකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාල බලපත්‍ර ගාස්තු ආදායම රු. 59,700 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ සිට බලපත්‍ර ගාස්තු බිල්කිරීමේදී වර්ෂය සඳහා වූ නියමිත ආදායම් බිල් කරන බව. | උපචිත පදනම මත බිල්කිරීම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබී තිබූ රු. 141,720 ක උසාවි දඩ අධි වෙන්කිරීම වෙනුවෙන් ගැලපීම් නොකර වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් මෙහෙයුම් ආදායම සමාන වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් සැකසීමේදී ජර්නල් සටහන් මඟින් නිවැරදි කරන බව. | වර්ෂයට අදාල ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයකට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. 57,905 ක් හා උපලේඛන අනුව වටිනාකම රු. 188,689 ක් වූයෙන් රු. 130,784 ක වෙනසක් විය. | බිල් කිරීමේ දෝෂයක් ඉදිරියේදී ගිණුම් සකස් කිරීමේදී මෙම වරද නිවැරදි කරන බව. | ගිණුම් දක්වන ශේෂය බැංකු ශේෂ සනාථන සමඟ සැසැඳිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 11,323,055 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 12,283,655 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 977,329 ක් වූ හිඟ වරිපනම් ශේෂය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණු අතර, 2014 වර්ෂයෙන් පසුව දේපල තක්සේරුවක් සිදුකර නොතිබුණි. | දේපල තහනම් කිරීමේ වැඩසටහන් සිදුකර ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරන බව. | සභාවට අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 61,325 ක් වූ හිඟ අක්කර බදු ශේෂයක් විය. | ඉදිරියේදී ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | සභාවට අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **වෙනත් ආදායම්** | | |
| | සභා බල ප්‍රදේශය තුල ස්ථාපිත කර ඇති දැන්වීම් පුවරු හඳුනා ගැනීම සඳහා වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබූ අතර, 2020 වර්ෂය සඳහා දැන්වීම් පුවරු 10 ක් වෙනුවෙන් අයවිය යුතු රු. 55,600 ක් අයකරගෙන නොතිබුණි. | මෙම දැන්වීම් පුවරු සඳහා ගාස්තු ගෙවන ලෙස ලිපි මඟින් දැනුම් දී ඇති බවත්, දැන්වීම් පුවරු ඉවත්කිරීම හේතුවෙන් ගාස්තු අයකර ගැනීමට නොහැකි බව. | සභාවට අයවිය යුතු ආදායම් අයකර ගත යුතුය. |
| **(ඇ)** | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ 2020 ජූලි සිට දෙසැම්බර් දක්වා කාලයට අදාල මුද්දර ගාස්තු රු. 6,105,290 ක් 2020 වර්ෂය අවසාන වනවිටත් හඳුනාගෙන තිබූ නමුත් අයකරගෙන නොතිබුණි. | මුද්දර ගාස්තු උපලේඛන සකස් කරනු ලබන්නේ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාල මඟින් බවත්,ඒ පිළිබඳ ඉල්ලීමක් කර ඇති බව. | වර්ෂයට අදාලව අයවිය යුතු ආදායම් නිවැරදිව හඳුනාගෙන අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා අරමුදල යෙදවිය හැකි කාර්යයන්ට පරිබාහිර වූ කාර්යයන් වෙනුවෙන් 2020 මාර්තු 26 දිනැති සභා වාර්තාවෙහි හදිසි යෝජනා 5.7(III) ප්‍රකාරව "කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් තම කොට්ඨාශ වල අසරණ ජනතාව වෙනුවෙන් සහන සැලසීම සඳහා" යැයි සඳහන් කරමින් එක් මහජන නියෝජිතයෙකුට රු. 25,000 බැගින් මහජන නියෝජිතයින් 16 දෙනෙකු වෙත එකතුව රු. 390,000 ක් ණය ලබා දී තිබුණි. | වසංගත තත්වය හේතුවෙන් කොට්ඨාශවල ජනතාව වෙනුවෙන් සහන සැපයීම සඳහා මහජන නියෝජිතයින්ට ලබාදුන් ණය මුදල අරමුණුගත කාර්යය සඳහා යෙද වූ බවට මහජන නියෝජිතයන්ගෙන් වාර්තාවක් ලබාගෙන ඇති බව. | ප්‍රාදේශීය සභා අරමුදල් පනතේ සඳහන් විධිවිධාන වලට පරිබාහිර කරුණු සඳහා නොයෙදවිය යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් අනවසර ඉදිකිරීම් හඳුනාගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු අතර, 2019 වර්ෂයේදී හඳුනාගෙන තිබූ අනවසර ඉදිකිරීම් 03 ක් නියමානුකූල කිරීමට හෝ ඉවත්කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. එමෙන්ම 2020 වර්ෂයේදී හඳුනාගෙන තිබූ අනවසර ඉදිකිරීම් 05 න් 04 ක් සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2019 වර්ෂයේ හඳුනාගෙන ඇති අනවසර ඉදිකිරීම් නියමානුකූල කිරීමට සභාවට ඉදිරිපත් කර ඇති බවත්, 2020 වර්ෂයේ අනවසර ඉදිකිරීම් සම්බන්ධව කාර්මික නිළධාරී පරීක්ෂාවට යොමුකර ඇති බවත්, ඉදිරියේදී ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | බල ප්‍රදේශය තුල පවත්නා අනවසර ඉදිකිරීම් හඳුනාගෙන ඊට අදාලව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1973 ජනවාරි 15 දින මුඩුක්කු සංහාර නිවාස යෝජනා ක්‍රමය සඳහා සභාව වෙත පවරා දී තිබූ ඉඩමෙහි පළමුව ඉදිකර තිබූ නිවාස 05 වෙනුවෙන් සින්නක්කර ඔප්පු 05 ක් නිකුත් කර තිබූ අතර, එම ඉඩම මැනුම් කර කොටස් 32 කට බෙදා තිබුණි. නිවිතිගල ප්‍රාදේශීය ලේකම්ගේ 2015 | පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත දැන්වීමෙන් අනතුරුව ප්‍රධාන ලේකම් වෙත නීතිමය උපදෙස් ලබාදෙන ලෙසට දන්වා ඇති බවත්, ඒ අනුව ලබාදෙන උපදෙස් හා අනුමැතියට අදාළව නිවාස වල පදිංචි කරුවන්ගේ ගැටළුව | පදිංචිකරුවන් වෙත අදාල ඔප්පු ලබාදී ගැටළුව නිරවුල් කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| අගෝස්තු 16 දිනැති ලිපිය මඟින් මෙම ඉඩම සභාව සතු ඉඩමක් බැවින් භුක්තිකරුවන් වෙත බලපත්‍ර ලබාදීම හා ගැටළු විසඳීමේ කටයුතු ප්‍රාදේශීය සභාව වෙත පවරා තිබුණද, දීර්ඝ කාලයක් තිස්සේ පවතින ඉහත ගැටළුව 2020 නොවැම්බර් වනවිටත් නිරාකරණය කර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | විසඳීමට කටයුතු කරන බව. | |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පොදු වෙළඳපල සංකීර්ණයේ ඉහල මහල ඉදිකිරීමේ කර්මාන්තයේ අදියර 03 ක් යටතේ ඉදිකිරීම නිමා කිරීමට අපේක්ෂිතව වෙන වෙනම ඇස්තමේන්තු කරන ලද ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල රු. 4,877,238 ක් විය. ඉහත අදියර 03 ට අදාල ඇස්තමේන්තු 2019 දෙසැම්බර් මස 17 දින අනුමත කර සීමිත ටෙන්ඩර් කැඳවා තිබූ අතර, එහිදී එක් කොන්ත්‍රාත්කරුවෙකු පමණක් ඉදිරිපත් වී තිබුණි. නැවත මිල ගණන් කැඳවීමකින් තොරව අදියර තුනම එක් ආයතනයක් වෙත 2020 පෙබරවාරි 11 දින ලබාදීමට ටෙන්ඩර් මණ්ඩලය කටයුතු කර තිබුණි. ඉහත සම්පූර්ණ කර්මාන්තය සඳහාම මුදල් රෙගුලාසි 20 ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට අවස්ථාව තිබියදී සම්පූර්ණ කර්මාන්තය වෙනවෙනම අදියර 03 ක් සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීම හේතුවෙන් විවෘත ටෙන්ඩර් කැඳවීමකින් තරඟකාරී මිල ගණන් ඉදිරිපත්වීමේ අවස්ථාව අහිමි වී ගොස් තිබුණි. ඒ හේතුවෙන් ප්‍රසම්පාදනයේ මූලික අරමුණක් වන තරගකාරීත්වයක් ඇතිකිරීම මඟින් ආයතනයට ලබාගත හැකිව තිබූ වාසි අහිමි වී තිබුණි. | පොදු වෙළඳ සංකීර්ණය ඉදිකිරීම අත්‍යාවශ්‍ය කටයුත්තක් බැවිනුත් මෙම ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සඳහා සභාව සතුව ප්‍රමාණවත් මුදල් නොමැති බැවින්ද වෙනත් අරමුදල් ප්‍රභවයන් යටතේ ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමේ අරමුණින් මෙලෙස ඇස්තමේන්තු අදියර කිහිපයක් යටතේ සකස් කරන ලද බව. | සංවර්ධන ව්‍යාපෘති සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර ප්‍රසම්පාදන පටිපාටිය මඟින් තරඟකාරීත්වය ප්‍රවර්ධනය කළ යුතුය. |